මාධ්‍ය තුළ කාන්තාවන් සම්බන්ධයෙන් සිදුවන කොන් කිරීම් විවිධ ආකාරයෙන් සිදුවේ. ඉන් බොහෝ විට දැකිය හැකි එක් ආකාරයක් වන්නේ, යම් කිසි වරදකට කාන්තා පාර්ශවයේ සහ පුරුෂ පාර්ශවයේ යන දෙපිරිසෙන්ම අයවලුන් අත්අඩංගුවට ගැනුණු පුවතක් ඉදිරිපත් කිරීමේදී කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට දැක්වීමයි.
ලංකාදීප පුවත්පතේ (07/12) පළවූ "නිධානයක් ගන්න මිදුලේ වළක් හෑරූ කතක් ඇතුළු 3 ක් දැලේ" යන සිරස්තලයත්, දිවයින පුවත්පතේ (07/14) "ඊසි කැෂ් ක්‍රමයට පොලොන්නරුවට කුඩු බෙදූ කාන්තාවක් සමඟ සිව් දෙනෙක් අත්අඩංගුවට" යනුවෙන් පළවූ සිරස්තලයත් ඊට උදාහරණ ලෙසින් දැක්විය හැක.
මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී කාන්තාව ඉස්මතු කොට දක්වන්නේ, එකම වරද පිරිමියෙකු සහ කාන්තාවක් යන දෙදෙනාම සිදුකළත්, එහිදී කාන්තාවගේ වරදට වැඩි බරක් වැටෙනා බවක් හුවා දැක්වීමටද? එය කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කොන් කිරීමක් නොවන්නේද? එසේම එය ආචාර ධාර්මික නොවන මාධ්‍යකරණයක්ද නොවේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Lankadeepa